# සමස්ථ ලංකා බන්ධනාගාර නිලධාරීන්ගේ ප්‍රාදේශීය සංගමය

# බන්ධනාගාර නිලධාරී එකමුතුව

2024/05/16

සියලුම බන්ධනාගාර අධිකාරීවරුන් හා සහකාර අධිකාරීවරුන්,

සියලුම ජේලර් නිලධාරීන්/නිලධාරිණියන්,

සියලුම සැරයන් නිලධාරීන්/නිලධාරිණියන්,

සියලුම නියාමක නිලධාරීන්/නිලධාරිණියන්,

සියලුම රියදුරු, වෘත්තීය පුහුණු ඇතුලු අනෙකුත් නිලධාරීන් හා නිලධාරිණියන්,

පෙර වකවානුවල දී බන්ධනාගාර නිලධාරීන්ගේ වැටුප හා පොලිස් නිලධාරීන්ගේ වැටුප සම තත්ත්වයක පැවතුන ද පසුකාලීනව බන්ධනාගාර නිලධාරී අපගේ වැටුපට වඩා පොලිස් නිලධාරීන්ගේ වැටුප විශාල ලෙස ඉහළ ගොස් ඇත.

2014 වසරේ සිට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්තුමන් නිලධාරීන් සඳහා වැටුප් වැඩි කිරීමක් ලබා දුන්නත් එවක සිටි ඉහල නිලධාරීන්ගේ කුහකකම් හා කකුල් මාට්ටු දැමීම් හමුවේ නිලධාරීන්ට ලබා ගත හැකි වුයේ කුඩා මුදලක් පමණි.

වත්මන් කොමසාරිස් ජෙනරාල්තුමා ඇතුලු 2014 වසරෙන් පසුව පත් වූ කිසිදු බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයෙකුවත් මෙම වැටුප් ගැටලුවට සාධනීය මැදිහත්මක් සිදු නොකරන ලද හෙයින් මේ වන විට 100කට අධික බන්ධනාගාර නිලධාරීන් පිරිසක් සේවය අතහැර විවිධ රැකියා හා විදේශගත රැකියා සඳහා ගොස් ඇති පසුබිමක දැනට රැඳී සිටින සේවකයින් රැක ගැනීම සඳහා කිසිදු වැඩ පිළිවෙළක් ඉහල නිලධාරීන්ට නොමැති බව පෙනී යයි.

**<u>එබැවින් රු.25000ක වැටුප් වැඩි වීමක් උදෙසා අධික ජීවන බරින් මිරිකී සිටින සියලු ශ්‍රේණි වලට අයත් බන්ධනාගාර නිලධාරීන් 2024/05/20 දින පෙ.ව. 6.00 සිට 2024/05/22 පෙ.ව. 6.00 දක්වා දින 02ක් අසනීප නිවාඩු වාර්තා කිරීමට තීරණය කර ඇත.</u>**

එබැවින් මෙම ඉල්ලීම් ඉල්ලනු ලබන්නේ කිසිදු තනතුරු බේදයකින් තොරව සමස්ථ බන්ධනාගාර නිලධාරීන් වෙනුවෙන් හෙයින් දිවයින පුරා පිහිටි සියලු බන්ධනාගාර ආයතනවල සියලු ශ්‍රේණි වල නිලධාරීන්ගේ සහයෝගය බලාපොරොත්තු වෙමු.